# ඉතිහාසයේ අසාධාරණය

අපගේ ඉතිහාසය බෙහෙවින් ම අසාධාරණය. කුමක් නිසා ද යත් එය බොහෝ විට ජයග්‍රාහකයා වීරයා බවටත් පරාජිතයා ද්‍රෝහියා බවටත් පත් කර ඇති හෙයිනි. ද්‍රවිඩ විමුක්ති අරගලය අසාර්ථක වීමේ වරදට ද්‍රවිඩ විමුක්තිකාමීන්ද (අප විරුද්ධ විය යුතු ව තිබුණේ ඔවුන්ගේ පිටුපස සැඟවුණු අධිරාජ්‍යවාදී අරමුණුවලට පමණි) ලාංකීය සමාජවාදී විප්ලවය අසාර්ථක වීමේ වරදට රෝහණ විජේවීරද , සිංහල ජාතිවාදී ව ලියැවුණු මහාවංශයට අනුව දුටුගැමුනුගේ බලලෝභීත්වයට එළාරද , අපේ රදළයින් නිසා රට සුද්දන්ට යාමේ වරදට ශ්‍රී වික්‍රම රාජසිංහද වරදකරුවෝ ය.

එපමණක් නොවේ .....

බ්‍රෙෂ්ට් තම 'වැඩකරුවකු ඉතිහාසය කියවයි ' පැදිපෙළේ ලියූ පරිදි ම වහළකු හෝ වැඩකරුවකු ඉතිහාසය කියවූවහොත් සීසර්ලාගේ ඇලෙක්සැන්ඩර්ලාගේ ජයග්‍රහණ මිස ඒ වෙනුවෙන් හෝ ඊට එරෙහිව සිය රට වෙනුවෙන් දිවි පිදූ සෙබළුන් ගැන සඳහන් නොවේ.

වත්මන් ඉතිහාසය තුළ පරාජිතයින් හා පීඩිතයින් යටපත් වී ඇත.සැබැවින් ම මීට වරදකරු ඉතිහාසය නොව බලලෝභී අරමුණුවලට අනුව ලියූවන් ය. නොපමාව අපගේ ඉතිහාසය වෙනස් කළ යුතු ව ඇත. වර්තමානයේ දී අප සටන් කළ යුත්තේ සාධාරණ ඉතිහාසයක් අනාගතයට උරුම කිරීමටයි.

-සචින්ත මදුෂාන්

---

පත්තරය,'තක්සලාව',ලංකාදීප (ඉරිදා) , 2012 ජුනි 17 .